# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 ජූනි 17 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2021 අප්‍රේල්

## සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2021 වසරේ අප්‍රේල් මාසයේ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. පෙර වසරට සාපේක්ෂව වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ අප්‍රේල් මාසයේ දී අඛණ්ඩව දෙවන වරටත් පුළුල් වූ අතර, සංචාරක අංශයේ ඉපැයීම් අඩු මට්ටමක පැවතුණි. 2020 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී අපනයන මෙන්ම ආනයන ද සැලකිය යුතු ලෙස ඉහළ අගයක පැවතුණ ද, 2021 වසරේ මාර්තු මාසය හා සැසඳීමේදී එම අගයයන් පහළ අගයක පැවතුණි. කෙසේ වෙතත්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගත්තේය. මේ අතර, චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් ඒකාබද්ධ ණය පහසුකම තුළින් වූ ලැබීම් සමඟ ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම මාසය තුළ දී ශක්තිමත් විය. අප්‍රේල් මාසයේ මැද භාගයේ ඇති වූ උච්චාවචනයන් හැරුණුකොට ශ්‍රී ලංකා රුපියල මාසය පුරාම සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2021 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2020 ජන.- අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2021 ජන.- අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 282 | 818 | 189.8 | 2,932 | 3,800 | 29.6 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,123 | 1,707 | 52.1 | 5,625 | 6,748 | 20.0 |
| වෙළඳ ශේෂය | -840 | -889 | | -2,693 | -2,948 | |
| සංචාරක ඉපැයීම් | - | 6 (ඇ) | - | 682 (ආ) | 19 (ඇ) | -97.3 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 375 | 519 | 38.3 | 1,975 | 2,386 | 20.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | - | -16 | | -28 | -107 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 142 | 500 (ඉ) | | 972 | 799 (ඊ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 1 | 0.1 | | 84 | 8 | |
| දිගුකාලීන ණය (දළ) | 141 | ලැ.නො. | | 388 | 291 (ඊ) | |
| ඒකාබද්ධ ණය පහසුකම (දළ) | - | 500 | | 500 | 500 | |
| සමස්ත ශේෂය | | | | -290 | -929 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) 2021 අප්‍රේල් මාසයේදී රාජ්‍ය අංශයේ දළ ලැබීම් දත්ත අතරට විදේශීය ණය ඇතුළත් නොවේ.
(ඊ) දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2021 මාර්තු මාසය දක්වා පමණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය: වෙළඳ ගිණුමේ හිඟය අඛණ්ඩව දෙවන මාසයටත් වැඩි වෙමින්, 2020 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ. ජ. ඩොලර් මිලියන 840ක සහ 2021 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ. ජ. ඩොලර් මිලියන 832ක හිඟයයන්ට සාපේක්ෂව, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී එ. ජ. ඩොලර් මිලියන 889ක් දක්වා පුළුල් විය.** 2021 වසරේ අප්‍රේල් මාසයේ දී අපනයන හා ආනයන යන දෙ අංශය ම ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම් පනවන ලද 2020 වසරේ අප්‍රේල් මාසය හා සැසඳීමේ දී සැලකිය යුතු ඉහළ අගයන් වාර්තා කළ ද, 2021 වසරේ මාර්තු මාසය හා සැසඳීමේ දී පහළ මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ ජනවාරි - අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ. ජ. ඩොලර් මිලියන 2,693ක සිට එ. ජ. ඩොලර් මිලියන 2,948ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය මෙසේ ඉහළ යෑම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූපසටහන 01 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2020 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2021 වසරේ අප්‍රේල් මාසයේ සියයට 5.5කින් පහළ ගිය අතර, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2021 වසරේ ජනවාරි - අප්‍රේල් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2020 -2021)**






**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2020 -2021)**






## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත අපනයන: කොවිඩ්-19 වසංගතයෙහි පළමු රැල්ලෙහි බලපෑම මත රට පුරා පනවන ලද ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම් මධ්‍යයේ 2020 වසරේ අප්‍රේල් මාසයේ දී එ. ජ. ඩොලර් මිලියන 282ක් ලෙස සැලකිය යුතු අඩු මට්ටමක පැවති වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2021 වසරේ අප්‍රේල් මාසයේ දී සියයට 189.8කින් එ. ජ. ඩොලර් මිලියන 818ක් දක්වා ඉහළ ගිය අතර, එය අප්‍රේල් මාසයක් තුළ දී වාර්තා වූ ඉතිහාසයේ ඉහළ ම අගය විය.** කෙසේ වෙතත්, වසංගතයේ තුන්වැනි රැල්ල ආරම්භ වීමේ බලපෑම සහ අලුත් අවුරුදු නිවාඩුව ආශ්‍රිතව සිදු වූ වෙනස්වීම් පිළිබිඹු කරමින්, 2021 වසරේ අප්‍රේල් මාසයේ වාර්තා වූ අපනයන ආදායම, 2021 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,094ක අපනයන ආදායමට වඩා සියයට 25.2කින් අඩු විය.

**කාර්මික අපනයන:** කාර්මික භාණ්ඩ අපනයන සඳහා අදාළ සියලුම උප අංශවල අපනයන ආදායම 2021 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 302.5කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඛනිජ තෙල් නිෂ්පාදිත; සම් භාණ්ඩ; සංචාරක භාණ්ඩ සහ පාවහන් (ප්‍රධාන වශයෙන් පාවහන්); සත්ත්ව ආහාර (සුනඛ සහ බළල් ආහාර); හා මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් මුදල් නෝට්ටු) හැර අනෙකුත් සියලු ම උප අංශවල කාර්මික අපනයන ආදායම මාසික ලක්ෂ්‍යමය පදනම මත සියයට 22.0කින් පහළ ගියේය. රෙදිපිළි හා ඇඟලුම්; රබර් නිෂ්පාදිත; යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන ආදායම 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව ප්‍රධාන වශයෙන් පහළ යෑම් වාර්තා කළේය. මේ අතර, ගුවන්යානා හා නැව් සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන මිල ගණන්වල සාමාන්‍යය ඉහළ යෑම මධ්‍යයේ වුව ද, මෙරටට පැමිණි ගුවන් යානා සහ නැව් සඳහා සපයන ලද ඉන්ධන සැපයුම් පරිමාවන් සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් ගුවන්යානා හා නැව් සඳහා භාවිත කරන ඉන්ධන අපනයන ආදායම පහළ ගිය අතර, නැප්තා

අපනයන ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර මාසයට සාපේක්ෂව ඉහළ ගියේය.

**කෘෂිකාර්මික අපනයන:** 2021 වසරේ අප්‍රේල් මාසයේ දී කෘෂිකාර්මික භාණ්ඩ සම්බන්ධ සියලුම උප අංශවල අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 37.7කින් ඉහළ ගිය නමුත්, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව සියයට 35.6කින් පහළ ගියේය. ඉහළ අපනයන මිල ගණන් යටතේ වුවද, අපනයන පරිමාව අඩු වීම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයේ දී තේ අපනයනයෙන් ලද ආදායම පෙර මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය. මීට අමතරව, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී, කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු, ගම්මිරිස් සහ කරාබු නැටි), පොල් (පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත මෙන්ම මද ආශ්‍රිත නොවන පොල් නිෂ්පාදිත), මුහුදු ආහාර සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනයෙන් ලද ආදායම 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**ඛනිජ අපනයන:** 2021 වසරේ අප්‍රේල් මාසයේ, ඛනිජ අපනයන සම්බන්ධ සියලුම උප අංශවල අපනයන ආදායම ද 2020 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව (සියයට 332.9කින්) ඉහළ ගිය නමුත්, 2021 මාර්තු මාසයට සාපේක්ෂව (සියයට 10.3කින්) පහළ ගියේය. 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2021 වසරේ අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම පහළ යෑම තුළින් පාෂාණ හා ගල් වර්ග (ප්‍රධාන වශයෙන් ක්වාට්ස්) සහ ලෝපස්, ලෝබොර හා අළු (ප්‍රධාන වශයෙන් ටයිටේනියම් ලෝපස්) යන උප කාණ්ඩයන්හි අපනයන ආදායම පහළ යෑම පිළිඹිබු විය.

**අපනයන දර්ශක:** 2021 වසරේ අප්‍රේල් මාසයේ දී, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 182.0කින් සහ සියයට 2.8කින් ඉහළ ගියේය. මෙමගින්, අපනයන ඉපැයීම් වර්ධනය සඳහා අපනයන පරිමා සහ මිල ගණන් යන සාධක දෙකෙහිම ඉහළ යාමේ ඒකාබද්ධ බලපෑම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව,ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




මූලය: ,ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2020 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2021 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2020 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2021 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **160.8** | **647.0** | **302.5** | **2,294.8** | **2,949.4** | **28.5** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 16.6 | 35.0 | 111.1 | 126.9 | 167.4 | 32.0 |
| සත්ත්ව ආහාර | 4.3 | 9.3 | 114.8 | 29.7 | 38.9 | 30.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 65.2 | 366.0 | 461.2 | 1,320.1 | 1,699.5 | 28.7 |
| එයින්, ඇඟලුම් | 58.1 | 336.9 | 479.4 | 1,222.0 | 1,556.0 | 27.3 |
| රෙදිපිළි | 5.1 | 20.6 | 300.2 | 70.1 | 98.9 | 41.2 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 1.9 | 8.5 | 340.1 | 28.0 | 44.5 | 59.0 |
| රබර් නිෂ්පාදිත | 24.2 | 61.6 | 154.4 | 220.3 | 317.9 | 44.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 0.1 | 24.2 | 18,053.4 | 54.7 | 95.0 | 73.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 9.0 | 31.0 | 244.5 | 95.4 | 156.0 | 63.5 |
| ප්‍රවාහන උපකරණ | 1.4 | 7.4 | 436.0 | 19.1 | 34.1 | 78.1 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 14.5 | 36.3 | 149.9 | 192.2 | 122.1 | -36.5 |
| රසායනික නිෂ්පාදිත | 7.7 | 15.3 | 99.3 | 45.4 | 68.3 | 50.3 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 2.8 | 8.4 | 205.3 | 29.3 | 39.7 | 35.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.0 | 12.3 | 1,094.2 | 11.7 | 22.1 | 88.2 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 1.0 | 3.8 | 262.1 | 17.6 | 14.9 | -15.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 1.3 | 5.0 | 276.9 | 16.3 | 24.2 | 48.4 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.2 | 8.7 | 39.7 | 37.7 | 42.0 | 11.4 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 0.3 | 2.0 | 499.0 | 6.4 | 11.3 | 75.5 |
| වෙනත් කාර්මික අපනයන | 5.0 | 20.8 | 316.0 | 71.8 | 96.2 | 34.0 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **120.3** | **165.6** | **37.7** | **626.8** | **829.4** | **32.3** |
| තේ | 78.4 | 79.3 | 1.1 | 348.4 | 417.4 | 19.8 |
| රබර් | 1.6 | 3.2 | 102.7 | 8.8 | 15.4 | 75.6 |
| පොල් | 14.3 | 27.3 | 91.3 | 84.7 | 123.6 | 45.9 |
| කුළුබඩු | 12.0 | 22.4 | 85.8 | 63.1 | 136.2 | 115.8 |
| එළවළු | 1.2 | 1.9 | 50.7 | 8.1 | 8.4 | 3.9 |
| සකස් නොකළ දුම්කොළ | 1.6 | 2.7 | 69.8 | 6.0 | 11.3 | 88.8 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 4.9 | 9.7 | 96.8 | 44.5 | 41.6 | -6.6 |
| මුහුදු ආහාර | 6.3 | 19.2 | 206.0 | 63.3 | 75.6 | 19.4 |
| **3. ඛනිජ අපනයන** | **1.0** | **4.2** | **332.9** | **5.9** | **16.0** | **172.6** |
| **4. වර්ග නොකළ අපනයන** | **0.3** | **1.3** | **412.3** | **4.4** | **5.6** | **25.6** |
| **මුළු අපනයන** | **282.3** | **818.2** | **189.8** | **2,931.9** | **3,800.3** | **29.6** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත ආනයන: වසංගතයේ පළමු රැල්ලෙහි බලපෑම සහ ඒ වන විට ගෝලීය වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් පහළ අගයක පැවතීම හේතුවෙන් 2020 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,123ක් ලෙස පහළ අගයක පැවති වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 1,707ක් දක්වා සියයට 52.1කින් ඉහළ ගියේය.** ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා අන්තර් සහ ආයෝජන භාණ්ඩ ආනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, 2021 වසරේ මාර්තු සහ අප්‍රේල් යන මාස දෙකෙහි ම ආනයන වියදම පූර්ව වසංගත මට්ටමට වඩා ඉහළ ගිය ද, 2021 වසරේ අප්‍රේල් මාසයේ ආනයන වියදම 2021 වසරේ මාර්තු මාසයට (එ.ජ. ඩොලර් මිලියන 1,926) සාපේක්ෂව (සියයට 11.4කින්) සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**පාරිභෝගික භාණ්ඩ:** ආහාර හා පාන වර්ග මෙන්ම ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙ අංශයෙහි ම ආනයන පහළ යෑමත් සමඟ 2021 වසරේ අප්‍රේල් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව සියයට 7.9කින් ද, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව සියයට 26.6කින් ද පහළ ගියේය. 2021 අප්‍රේල් මාසයේ දී, ආහාර හා පාන වර්ග යටතේ වන සීනි සහ රසකැවිලි; එළවළු (ප්‍රධාන වශයෙන් ලොකු ළූණු, පරිප්පු සහ අර්තාපල්); කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි); කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්) සහ තෙල් සහ මේද වර්ග වැනි ආහාර හා පාන වර්ග ආනයනය සඳහා වන වියදම මාසික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. එමෙන්ම, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ, විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන් ජංගම දුරකථන), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන් ශීතකරණ සහ විදුලි පංකා) මත වන ආනයන වියදම මාසික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී, මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන් කරවල) සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සහල්) ආනයනය කිරීම සඳහා වන වියදම 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව ඉහළ ගියේය.

**අන්තර් භාණ්ඩ:** 2021 වසරේ අප්‍රේල් මාසයේ දී අන්තර් භාණ්ඩ සඳහා වන ආනයන වියදම, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 88.6කින් ඉහළ ගිය නමුත්, පෙර මාසයට සාපේක්ෂව සියයට 4.9කින් පහළ ගියේය. 2021 වසරේ අප්‍රේල් මාසයේ දී, විශේෂයෙන් මූල ලෝහ (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ); ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත; රෙදිපිළි සහ රෙදිපිළි උපාංග; ආහාර සැකසුම්; සහ රබර් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත ඇතුළු වෙනත් බොහෝ අන්තර් භාණ්ඩ සඳහා වන ආනයන වියදම් 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, ඉන්ධන, පොහොර සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගියේය. 2021 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් පිරිපහදුවේ නඩත්තු කටයුතු හේතුවෙන් බොරතෙල් ආනයනය කර නොමැති අතර, 2021 වසරේ පෙබරවාරි මාසයේ එ.ජ. ඩොලර් 64.07ක් වූ බොරතෙල් බැරලයක ආනයන මිලෙහි සාමාන්‍යය, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 66.44ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ආනයන පරිමාවන් හා ආනයන මිල

ගණන්වල සාමාන්‍යය පහළ යෑම හේතුවෙන්, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව පිරිපහදු කළ ඛනිජ තෙල් හා ගල් අඟුරු සඳහා වන වියදම පහළ ගියේය. මීට අමතරව, ඉහළ ගිය ආනයන මිල ගණන් හා පරිමාවන් හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී පොහොර සඳහා වන ආනයන වියදම, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ඛනිජ නිෂ්පාදිත සඳහා වන ආනයන වියදම ඉහළ යෑම සඳහා සිමෙන්ති ක්ලින්කර ආනයන ප්‍රධාන වශයෙන් හේතු විය.

**ආයෝජන භාණ්ඩ:** 2021 වසරේ අප්‍රේල් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2020 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව සියයට 41.4කින් ඉහළ ගිය ද, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව සියයට 15.2කින් පහළ ගියේය. 2021 වසරේ අප්‍රේල් මාසයේ දී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ අනෙකුත් ආයෝජන භාණ්ඩ වැනි ආයෝජන භාණ්ඩ සම්බන්ධ සියලුම උප අංශවල ආනයන වියදම, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව පහළ ගියේය. විදුලි මෝටර සහ විදුලි ජනක කට්ටල; කාර්යාල යන්ත්‍රසූත්‍ර; වෛද්‍ය සහ රසායනාගර උපකරණ; හා ටර්බයින සඳහා වන ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම මාසික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. මීට අමතරව, අනෙකුත් උප කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම සඳහා දැව නිෂ්පාදිත, සිමෙන්ති සහ කෘෂිකාර්මික ට්‍රැක්ටර් ආනයනය සඳහා වන වියදම පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මීට ප්‍රතිවිරුද්ධව, 2021 අප්‍රේල් මාසයේ දී ලොරි, පොම්ප, ඛනිජ නිෂ්පාදිත (ඇස්බැස්ටෝස් සහ හුණු වැනි), කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර, පරිවරණය කළ වයර් හා කේබල් සහ පිඟන් මැටි නිෂ්පාදිත සඳහා වන ආනයන වියදම, 2021 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව ඉහළ ගියේය.

**ආනයන දර්ශක:** 2021 වසරේ අප්‍රේල් මාසයේ දී ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙලින්, සියයට 39.8කින් සහ සියයට 8.8කින් ඉහළ ගියේය. මෙමගින්, ආනයන වියදම ඉහළ යෑම සඳහා ආනයන පරිමා සහ මිල ගණන් ඉහළ යාමේ ඒකාබද්ධ බලපෑම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව,ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2020 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2021 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2020 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2021 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **302.5** | **278.6** | **-7.9** | **1,268.6** | **1,276.5** | **0.6** |
| ආහාර හා පාන වර්ග | 136.8 | 123.5 | -9.7 | 563.2 | 628.8 | 11.6 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.0 | 3.4 | 70.1 | 13.9 | 12.8 | -8.0 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 27.3 | 24.8 | -9.3 | 124.1 | 114.9 | -7.4 |
| එළවළු (ආ) | 40.9 | 26.9 | -34.1 | 145.6 | 138.0 | -5.2 |
| මුහුදු ආහාර | 18.7 | 8.4 | -55.0 | 65.3 | 33.1 | -49.3 |
| සීනි හා රසකැවිලි | 15.3 | 30.0 | 96.5 | 88.3 | 167.4 | 89.5 |
| කුළුබඩු | 15.3 | 9.8 | -36.0 | 50.2 | 47.5 | -5.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 17.4 | 20.3 | 16.4 | 75.8 | 115.2 | 51.9 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 165.7 | 155.1 | -6.4 | 705.4 | 647.7 | -8.2 |
| පෞද්ගලික රථවාහන | 60.4 | 1.1 | -98.2 | 216.8 | 3.5 | -98.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 39.4 | 48.6 | 23.1 | 164.8 | 192.3 | 16.7 |
| ගෘහ උපකරණ | 16.0 | 26.4 | 65.7 | 66.5 | 97.6 | 46.8 |
| රෙදිපිළි හා උපාංග | 12.2 | 19.2 | 57.8 | 85.3 | 74.9 | -12.2 |
| විදුලි සංදේශ උපකරණ | 14.3 | 27.2 | 89.9 | 63.0 | 137.0 | 117.4 |
| ගෘහ හා දැව භාණ්ඩ | 10.4 | 10.7 | 2.4 | 48.3 | 53.5 | 10.8 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 13.0 | 21.9 | 68.5 | 60.6 | 88.7 | 46.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **570.0** | **1,075.0** | **88.6** | **3,115.7** | **4,065.7** | **30.5** |
| ඉන්ධන | 121.8 | 413.2 | 239.2 | 1,070.1 | 1,390.3 | 29.9 |
| එයින්, බොරතෙල් | 14.2 | 97.1 | 582.9 | 209.2 | 224.2 | 7.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 84.8 | 286.1 | 237.3 | 734.6 | 1,039.6 | 41.5 |
| ගල්අඟුරු | 22.8 | 29.9 | 31.5 | 126.3 | 126.5 | 0.2 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 1.5 | 7.0 | 370.8 | 27.2 | 43.5 | 60.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 146.9 | 228.4 | 55.5 | 768.9 | 938.6 | 22.1 |
| කඩදාසි හා ඝන කඩදාසි | 29.1 | 41.0 | 40.7 | 120.0 | 146.8 | 22.3 |
| කෘෂිකාර්මික යෙදවුම් | 18.5 | 19.1 | 3.1 | 69.3 | 86.6 | 24.9 |
| තිරිඟු හා ඉරිඟු | 9.0 | 26.7 | 197.1 | 88.8 | 120.2 | 35.3 |
| මූල ලෝහ | 38.6 | 40.7 | 5.6 | 136.8 | 194.2 | 42.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 41.1 | 57.1 | 38.9 | 168.0 | 257.8 | 53.5 |
| රසායනික නිෂ්පාදිත | 64.9 | 90.0 | 38.7 | 255.5 | 364.6 | 42.7 |
| පොහොර | 29.2 | 47.3 | 62.0 | 55.0 | 82.2 | 49.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 13.1 | 32.4 | 146.8 | 80.6 | 133.4 | 65.6 |
| ඛනිජ නිෂ්පාදිත | 12.4 | 16.8 | 34.9 | 52.4 | 44.5 | -15.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 43.9 | 55.4 | 26.2 | 223.1 | 263.0 | 17.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **249.6** | **353.0** | **41.4** | **1,233.4** | **1,403.1** | **13.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 113.1 | 227.9 | 101.5 | 685.5 | 913.0 | 33.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 65.0 | 98.1 | 51.0 | 359.4 | 381.8 | 6.2 |
| ප්‍රවාහන උපකරණ | 71.3 | 26.8 | -62.4 | 187.4 | 107.7 | -42.5 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.2 | 0.1 | -24.8 | 1.0 | 0.6 | -41.1 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **0.3** | **-35.9** | **7.7** | **2.8** | **-63.6** |
| **මුළු ආනයන** | **1,122.6** | **1,707.0** | **52.1** | **5,625.3** | **6,748.1** | **20.0** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,000.8** | **1,293.8** | **29.3** | **4,555.3** | **5,357.8** | **17.6** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**2021 වසරේ අප්‍රේල් මාසයේ දී සංචාරක අංශය තුළ සීමිත සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා විය.** 2021 වසරේ මාර්තු මාසයේ 4,581ක් වූ සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 අප්‍රේල් මාසයේ දී පැමිණි සංචාරකයින් ප්‍රමාණය 4,168ක් විය. 2020 වසරේ පළමු මාස හතර තුළ පැමිණි 507,311ක් වූ සංචාරකයින් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 වසරේ අනුරූප කාල පරිච්ඡේදය තුළ සංචාරක පැමිණීම් ප්‍රමාණය 13,797ක් ලෙස වාර්තා විය. 2021 වසරේ අප්‍රේල් මාසය තුළ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණි රටවල් වූයේ ඉන්දියාව, චීනය සහ කසකස්තානය යි. සංචාරකයින්ගේ පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තු කරනු ලබන සංචාරක ඉපැයීම් 2021 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 6ක් විය. සමුච්චිත සංචාරක ඉපැයීම් 2021 වසරේ පළමු මාස හතර තුළ එ.ජ. ඩොලර් මිලියන 19ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලර් මිලියන 682ක් ලෙස වාර්තා විය.

**2021 වසරේ අප්‍රේල් මාසයේ දී ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩව සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය.** ඒ අනුව, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 519ක් දක්වා සියයට 38.3කින් වර්ධනය විය. පෙර වසරේ අනුරූප මාසයේ දී වසංගතයේ පළමු රැල්ල ආරම්භයත් සමඟ ඇති වූ මූලික බලපෑම මෙන්ම, සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සව සමයේ බලපෑම මෙම ඉහළ වර්ධන වේගයට හේතු වූ කරුණු විය. වසරේ පළමු මාස හතර තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 2,386ක් දක්වා සියයට 20.8ක වර්ධනයක් වාර්තා කළේය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

**2021 වසරේ අප්‍රේල් මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය.** 2021 වසරේ පළමු මාස හතර තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 5ක සමුච්චිත ශුද්ධ ගෙවීමක් වාර්තා විය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2021 වසරේ අප්‍රේල් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 31ක අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 16ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2021 වසරේ පළමු මාස හතර තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 107ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. 2021 වසරේ අප්‍රේල් මාසයේ දී රජය වෙත වූ දිගු කාලීන ණයෙහි දළ ලැබීම් තුළ එ.ජ. ඩොලර් මිලියන 500ක් වූ චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් ඒකාබද්ධ ණය පහසුකම ඇතුළත් විය.

## ජාත්‍යන්තර සංචිත

**2021 වසරේ අප්‍රේල් මාසය අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4.5ක් වූ අතර, එය මාස 3.1ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය.** මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2021 වසරේ අප්‍රේල් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 7.1ක් වූ අතර, එම ප්‍රමාණය මාස 4.9ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය. ඉහත වාර්තා කර ඇති සංචිත මට්ටම තුළ චීන මහජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කිරීමට යෙදුණු චීන යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක) තුන් අවුරුදු ද්වීපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ.

**සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**2021 වසරේ අප්‍රේල් මාසයේ දී විනිමය අනුපාතිකය තාවකාලිකව විශාල වශයෙන් අතිප්‍රමාණය වීමක් දක්නට ලැබුණි.** 2021 වසරේ මාර්තු අග සිට 2021 වසරේ අප්‍රේල් මැද දක්වා සමාන මට්ටම්වල පැවති විනිමය අනුපාතිකය, චීන සංවර්ධන බැංකුවෙන් ඒකාබද්ධ ණය පහසුකම ලැබීමත් සමඟ විශාල වශයෙන් අතිප්‍රමාණය විය. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය මාසය අවසන් වන විට පෙර පැවති මට්ටම් කරා නැවත ළඟා විය.. සමස්තයක් ලෙස, අප්‍රේල් මාසය තුළ, එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අවප්‍රමාණය වීම සියයට 0.3කට සීමා විය. 2021 වසරේ ජූනි 17වන දින දක්වා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.7කින් අවප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූනි 17 දක්වා ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලිං පවුම, ඔස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ජපන් යෙන්වලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. දළ නිල සංචිත ණය නොවන ප්‍රභවයන් මාර්ගයෙන් ඉහළ නංවා ගැනීමේ අරමුණ ඇතිව 2021 වසරේ අප්‍රේල් මාසයේ දී මෙන්ම මේ දක්වා මෙම වසර තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිල දී ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 | 2021 (ජූනි 17 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.6% | -6.7% |
| යුරෝ | +2.6% | -11.2% | -4.4% |
| ස්ටර්ලිං පවුම | -2.8% | -6.2% | -9.1% |
| ජපන් යෙන් | -1.0% | -7.5% | +0.1% |
| ඔස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -11.4% | -5.8% |
| ඉන්දියානු රුපියල | +2.6% | 0.0% | -6.6% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව